## ආර්.කේ. ආරියරත්න එ. ජාතික විගණන කාර්යාලය

RTIC Appeal (පුද්ගලික වශයෙන් විභාග කිරීම)/1466/19 (2019.12.17 දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේදී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය).

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචන කාර්යය පටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යය පටිපාටිය.

**සභාපති:** මහින්ද ගම්මම්පිල
**කොමිෂන් සභා සමාජික:** ජොෂ්ඨ නීතිඥ කිෂාලි පින්ටෝ-ජයවර්ධන
**කොමිෂන් සභා සමාජික:** ජොෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා

**අභියාචක** - ආර්.කේ. ආරියරත්න
**නොතිසි ලත් පාර්ශවය** - නම්කළ නිලධාරි, ජාතික විගණන කාර්යාලය

**පෙනීසිටීම**
අභියාචක - ආර්.කේ. ආරියරත්න
පොදු අධිකාරිය - එස්.ජී. තුෂාරි ඉන්දිකා
ජී.කේ.යූ. අබේරත්න
ජී.එල්.ඒ.එච්.කේ. ලියනාරච්චි

| | |
|---|---|
| තොරතුරු ඉල්ලීම ගොනු කරන ලද දිනය | 2018.10.15 |
| තොරතුරු නිළධරයා තීරණය ලබා දුන් දිනය | 2018.11.14 |
| නම් කල නිළධරයා වෙත අභියාචනය යොමු කළ දිනය | 2018.11.30 |
| නම් කල නිළධරයා තීරණය ලබා දුන් දිනය | ප්‍රතිචාර නොමැත |
| තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත අභියාචනය යොමුකළ දිනය | 2019.04.10 |

**අභියාචනයට පසුබිම්වූ කරුණු:**

අභියාචක 2018.10.15 දිනැති තොරතුරු ඉල්ලීම මගින් පහත තොරතුරු ඉල්ලා සිටින ලදී.

*(අ) පහත නම් සඳහන් සහකාර විගණකාධිපති නිලධාරීන් විසින් නියෝජ්‍ය විගණකාධිපති තනතුරට ඉල්ලුම් කිරීම සඳහා 2017 වර්ෂයේදී ඉදිරිපත් කරන ලද අයදුම්පත්‍ර සහ ඒ සමඟ යා කර තිබුණු ලේඛන සහ උපලේඛන වල සහතික කරන ලද පිටපත්.*

*1.P.L.K. පෙරේරා මයා. 8.T. ප්‍රේමලතා මිය.*
*2. E.A.G. ආනන්ද මයා. 9. A. චන්ද්‍රපාල මයා.*
*3. G.A.M.I. ගුණරත්න මයා. 10.K.K.V. ධර්මසිරි මයා.*
*4. G. තේවගනම් මයා. 11. H.P.N.. පද්මසිරි මයා.*

*5.R.R.H. අබේසිංහ මයා.      12.A.M. සඳක තුල්ලා මයා.*
*6. R.M.J රත්නායක මයා.      13. N.R.M. ධර්මසිරි මයා.*
*7.S. රණතුංග මිය.      14.R.H. රත්නායක මයා.*

*(ආ) පහත නම් සඳහන් විගණන අධිකාරී වරුන් (II -I) සහකාර විගණකාධිපති තනතුර සඳහා 2013 වර්ෂයේදී ඉල්ලුම් කිරීමට ඉදිරිපත් කරන ලද අයදුම්පත්‍ර ඒ සමඟ යා කර තිබුණු ලේඛන සහ උපලේඛන වල සහතික කරන ලද පිටපත්.*

*1.E.A.G. ආනන්ද මයා.      7. G. තේවගනම් මයා.*
*2.A. චන්ද්‍රපාල මයා.      8. R.M.J රත්නායක මයා.*
*3.S. රණතුංග මිය.      9.T. ප්‍රේමලතා මිය.*
*4.P.L.K. පෙරේරා මයා.      10. N.R.M. ධර්මසිරි මයා.*
*5. G.A.M.I. ගුණරත්න මයා.      11.R.R.H. අබේසිංහ මයා.*
*6. M.S. නයනකුමාර මයා      12.K.K.V. ධර්මසිරි මයා.*

*(ඇ) පහත නම් සඳහන් අයදුම්කරුවන් විසින් ශ්‍රී ලංකා විගණන සේවයට ඇතුලත් වීම සඳහා වූ විවෘත තරඟ විභාගයට අයදුම් කිරීමට ඉදිරිපත් කරන ලද අයදුම්පත්‍ර වල සහ ඒ සමඟ ඉදිරිපත් කර තිබුණු ලේඛන සහ උපලේඛන වල සහතික කරන ලද පිටපත්.*

*1.H.P.N.. පද්මසිරි මයා      5. R.M.J රත්නායක මයා.*
*2.M.P. ධර්මරත්න මයා.      6.T. ප්‍රේමලතා මිය.*
*3. G. තේවගනම් මයා.      7. N.R.M. ධර්මසිරි මයා.*
*4.P.G. චන්ද්‍රරත්න මයා      8. I. සමරගේ මිය*

මීට ප්‍රතිචාර ලෙස තොරතුරු නිලධාරී විසින් 2018.11.14 දිනැතිව දන්වා එවා ඇත්තේ ඉල්ලා ඇති නිලධාරීන්ගේ අයදුම්පත්, එයට අමුණා තිබූ ලේඛන හා උපලේඛන සහිත ගොනු එකී සම්මුඛ පරීක්ෂණ අවසානයේදී රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති බැවින් ඒ සම්බන්ධ තොරතුරු නොමැති බවයි. මෙම ප්‍රතිචාරයෙන් අතෘප්තියට පත් අභියාචක 2018.11.30 දිනැතිව නම්කළ නිලධරයා වෙත අභියාචනයක් යොමු කරන ලදී. නම්කළ නිලධාරයා පනත ප්‍රකාරව නියමිත කාලය තුළ ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වූ බැවින් අභියාචක 2019.04.10 දිනැතිව කොමිෂන් සභාව වෙත අභියාචනයක් යොමු කරන ලදී.

**අභියාචනය සලකා බලන අවස්ථාවේදී උද්ගතවූ කාරණා:**

අභියාචනා විභාගය සඳහා දෙපාර්ශවයම පැමිණ ඇතිබව කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කර සිටී.

පොදු අධිකාරිය විසින් කරුණු දක්වා සිටියේ ඔවුන්ට ලබා දිය හැකි මට්ටමේ තොරතුරු මේ වනවිට ලබා දී ඇති බවය. නමුත් අයදුම්පත්‍ර පෞද්ගලික තොරතුරු ගණයෙහි ලා සැලකිය හැකි බැවින් එම තොරතුරු ලබා දිය නොහැකි බවත් එම අයදුම්පත්‍ර මේ වන විට සිය අධිකාරියේ භාරයේ හෝ සන්තකයේ නොමැති බවටත් කරුණු දක්වා සිටින ලදි.

එසේම 2019.07.24 දිනැතිව පොදු අධිකාරිය විසින් කොමිෂන් සභාවට දන්වා ඇත්තේ අදාළ අයදුම්පත්‍ර තමන් සතුව නොමැති බවත් එම අයදුම්පත්‍ර රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් ලබාගැනීමට මේ වන විට කටයුතු කරමින් සිටින බවයි.

ඒ අනුව කොමිෂන් සභාව විසින් පොදු අධිකාරියෙන් විමසා සිටින ලද්දේ අදාළ අයදුම්පත්‍ර පොදු අධිකාරිය සතුව නොමැති නම් ඊට අදාළ සනාථ කිරීම් හෝ අදාළ අයදුම්පත්‍ර විමසමින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට යොමුකරන ලද ලිපි ලේඛන හෝ ඉදිරිපත් කළ යුතු බවයි. නො එසේනම්, අදාළ අයදුම්පත්‍ර පොදු අධිකාරියේ භාරයේ හෝ සන්තකයේ නොමැති බවට පිළිගැනීමට අපහසු වන බව අවධාරණය කර සිටී.

**නියෝගය:**

ඒ අනුව අදාළ අයදුම්පත්‍ර විමසමින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට යොමු කරන ලද ලිපිය ඉදිරිපත් කිරීමටත් අභියාචක විසින් ඉල්ලා ඇති වර්ගවලට අදාළ තොරතුරු පොදු අධිකාරිය සතුව නොමැති නම් එය තහවුරු කිරීමටත් පොදු අධිකාරියට මින් නියෝග කරනු ලැබේ.

මීළඟ අභියාචනා විභාගය 2020.02.18 දින ප.ව. 1.00ට කල් තබනු ලැබේ.

කොමිෂන් සභා රීතීන්හි, රීති අංක 27 (ගාස්තු හා අභියාචනා කාර්යපටිපාටිය, ගැසට් අංක 2004/66, 2017.02.03) ප්‍රකාරව මෙම නියෝගය දෙපාර්ශවය වෙත සන්නිවේදනය කරනු ලැබේ.

*****